සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 1 |

නම :- ........................................................................ විභාග අංකය :- ........................................

<u>සැලකිය යුතුයි</u>

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 කි.
- පහත සඳහන් ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

01. බෝසතාණන් වහන්සේ විසින් සිදුකරන ලද "පංච මහා විලෝකනය" ට තවත් නමක් වන්නේ,

i. පංච සීලය යන්නයි. ii. පස්මහ බැලුම් යන්නයි.
iii. පංච වාදය යන්නයි. iv. පංච ස්කන්ධය යන්නයි.

02. සුදොවුන් පිය රජතුමා කැමති වූයේ තම සිදුහත් පුත් කුමරා,

i. තාපසයකු බවට පත්වනු දැකීමටයි.
ii. බුද්ධත්වයට පත්වනු දැකීමටයි.
iii. සක්විති රජකු බවට පත්වනු දැකීමටයි.
iv. තමන්ගේ යුවරජු බවට පත්වනු දැකීමටයි.

03. බුදුරජාණන් වහන්සේ "අරහං" නැමැති ගුණ රාශියෙන් පිදුම් ලැබීමට සුදුසු එක් කරුණක් වන්නේ

i. දෙවි මිනිසුන්ගේ ගුරුවරයා වූ නිසාය.
ii. රහසින්වත් පවු නොකළ නිසාය.
iii. දරුණු අය දමනය කළ නිසාය.
iv. සත්සුන් ගමන් ඇති නිසාය.

04. යහපත් හෙවත් කුසල් අරමුණක සිත එකඟ කර ගැනීම,

i. "භාවනා" නම් වේ. ii. "සීලය" නම් වේ.
iii. "දානය" නම් වේ. iv. "ඛන්තී" නම් වේ.

05. අප විසින් පාලනය කිරීමටත් යටපත් කිරීමටත් උත්සාහ ගත යුත්තේ,

i. මෝහ සිතිවිලිය. ii. මුදිතා සිතිවිලිය.
iii. අදෝස සිතිවිලිය. iv. මෙත්තා සිතිවිලිය.

06. ත්‍රිලක්ෂණය පිළිබඳව හොඳ අවබෝධයක් ලබාගත් පුද්ගලයන් කැමති වන්නේ,

i. අල්පේච්ඡ ජීවිතයකටයි.
ii. මහිච්ඡ ජීවිතයකටයි.
iii. අන්තගාමී ජීවිතයකටයි.
iv. පසුගාමී ජීවිතයකටයි.

07. රුහුණු රජ පෙළපතට අයත් කාවන්තිස්ස රජුගේ හා විහාර මහා දේවියගේ අභීත වැඩිමහල් පුත්‍රයා,

i. අභය කුමාරයා ය.
ii. තිස්ස කුමාරයා ය.
iii. මහසෙන් කුමාරයා ය.
iv. ගැමුණු කුමාරයා ය.

08. සීලයේ ප්‍රධාන ප්‍රභේද දෙක අතරින් කළ යුතු යහපත් දේ කිරීම,

i. විරමණ නම් වේ.
ii. වාරිත්‍ර නම් වේ.
iii. සමාදාන නම් වේ.
iv. විරිත් නම් වේ.

09. බුදුරජාණන් වහන්සේ “දකුණු දිසාවට” උපමා කොට වදාළේ,

i. හිත මිතුරන් ය.
ii. පැවිදි උතුමන් ය.
iii. ගුරුවරුන් ය.
iv. ස්වාමි භාර්යාවයන් ය.

10. සිගාලෝවාද සූත්‍රය අනුව දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකමක් වන්නේ,

i. කුල පරපුරට අයත් සිරිත් විරිත් රැකදීමයි.
ii. තමන් සතු සම්පත් තිසි කාලයේ පවරාදීමයි.
iii. තමන්ගේ හිත මිතුරන්ට හඳුන්වාදීමයි.
iv. වරදින් මුදවා සුමගට යොමු කිරීමයි.

11. ලෝකයේ සාමාන්‍ය මිනිස්සු රාගයෙන් රාගයටත්, ද්වේශයෙන් ද්වේශයටත්, මෝහයෙන් මෝහයටත් ගමන් කරති. මෙය,
i. අනුසෝතගාමී ස්වභාවයයි.
ii. පටිසෝතගාමී ස්වභාවයයි.
iii. නිර්වානගාමී ස්වභාවයයි.
iv. අනාගාමී ස්වභාවයයි.

12. මඩ දියෙහි ඉපිද ඉන් ඉහළට මතු වූ විකසිත පියුම්වලට උපමාකොට ඇත්තේ,

i. බුද්ධාදී උතුමන් ය.
ii. සක්විති රජවරුන් ය.
iii. දිව්‍ය බ්‍රහ්මාදීන් ය.
iv. සාමාන්‍ය මිනිසුන් ය.

13. විදුහලේ දක්වා තිබූ අදර්ශ පාඨ අතර “සාමාචායෝ ඒව සාධු” යන්නද තිබුණි. එහි අදහස,

i. “සමගි වන්න විවාද නොකරන්න” යන්නයි.
ii. “සමගිය බලය වේ” යන්නයි.
iii. “සමගියෙන් ජීවිතය ජයගන්න” යන්නයි.
iv. “සමගිය ම යහපති” යන්නයි.

14. බෞද්ධයන් ලෙස දැහැමි රැකියාවන්හි නිරත විය යුතු බව බුදුදහමෙහි උගන්වනු ලබන්නේ,

i. සම්මා වාචා ලෙසයි.
ii. සම්මා කම්මන්ත ලෙසයි.
iii. සම්මා ආජීව ලෙසයි.
iv. සම්මා වායාම ලෙසයි.

15. කර්මය පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. "කර්මය යනු ඕනෑම ක්‍රියාවක්ය" යන්නයි.
ii. "කර්මය යනු සචේතනික ක්‍රියාවක්ය" යන්නයි.
iii. "කර්මය යනු පාප ක්‍රියා පමණක්ය" යන්නයි.
iv. "කර්ම යනු නොදැනුවත්ව කරන ඒවාය" යන්නයි.

16. අභිද්‍යාව, ව්‍යාපාදය හා මිථ්‍යා දෘෂ්ටිය අයත් වන්නේ,

i. කුසල කර්මවලටයි.
ii. කාය කර්මවලටයි.
iii. වචී කර්මවලටයි.
iv. මනෝ කර්මවලටයි.

17. ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කළ යුතු අවස්ථාවල එසේ නොකොට කර්මයට ඉඩදී විපතට පත්වීම,

i. ගති විපත්තියයි.
ii. උපධි විපත්තියයි.
iii. කාල විපත්තියයි.
iv. ප්‍රයෝග විපත්තියයි.

18. සසර දුකින් එතෙර වීම සඳහා අවශ්‍ය අවසානම සුදුසුකම,

i. සිල්වත් භාවයයි.
ii. තිලකුණු ගැන අවබෝධයයි.
iii. පැවිදි බව ලැබීමයි.
iv. ධ්‍යාන උපදවා ගැනීමයි.

19. "ස්ථිර, නොවෙනස් වන, මම, මගේ යැයි ගත හැකි පදාර්ථයක් නැත." යන අදහස උගන්වන්නේ,

i. අනිත්‍ය ලක්ෂණයෙනි.
ii. දුඃඛ ලක්ෂණයෙනි.
iii. අනාත්ම ලක්ෂණයෙනි.
iv. භෞතික ලක්ෂණයෙනි.

20. අස්සජි මහ රහතන් වහන්සේ උපතිස්ස පිරිවැජි තුමාට දේශනා කළ ගාථාව,

i. මනෝපුබ්බංගමා ධම්මා....... යන්නයි.
ii. යේ ධම්මා හේතුප්පභවා ........ යන්නයි.
iii. උට්ඨානවතෝ සතිමතෝ ....... යන්නයි.
iv. අනිච්චාවත සංඛාරා ......... යන්නයි.

21. “ඉමස්මිං සති ඉදං හෝති” යන පාඨයේ අදහස,

i. මෙය නැති කල්හි මෙය නූපදී යන්නයි.
ii. මෙය ඇති කල්හි මෙය නූපදී යන්නයි.
iii. මෙය ඇති කල්හි මෙය වෙයි යන්නයි.
iv. මෙය ඉපදීමෙන් මෙය උපදී යන්නයි.

22. යමකු තුළ තණ්හාව ඇත්නම් ඔහු තුළ නියතව ඇති විය හැක්කේ,

i. ආශාවයි.
ii. දුකයි.
iii. කලකිරීමයි.
iv. අත හැරීමයි.

23. බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ උත්තරීතර පරම සත්‍යය වනුයේ,

i. චතුරාර්ය සත්‍යයයි.
ii. පංච සීල ප්‍රතිපදාවයි.
iii. දානයේ ආනිසංසයි.
iv. ධ්‍යාන උපදවා ගැනීමයි.

24. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ පරිදි පරිසරයේ යහ පැවැත්ම රැකෙන ලෙස වන උයන් ළිං පොකුණු සෑදීමෙන්,
i. බඹ ලොව උපත ලද හැකිය.
ii. නිවන් සම්පත් අවබෝධ කළ හැකිය.
iii. දුගති දුක් සියල්ල නැති කළ හැකිය.
iv. දිවා රෑ පින් වඩවාගත හැකිය.

25. බුදුරජාණන් වහන්සේ පිරිණිවන් පා වදාළේ,

i. ලුම්බිණි සල් උයනේ දී ය.
ii. ඇසතු බෝධිමූලයේ දී ය.
iii. උපවර්තන සල් උයනේ දී ය.
iv. ඉසිපතන මිගදායේ දී ය.

26. ශ්‍රේෂ්ඨතම වෛද්‍යවරයකු වූ බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රතිකාර කරන ලද්දේ,

i. වා පිත් සෙම් නිසා හටගන්න රෝගවලටයි.
ii. රාග දෝස මෝහ නිසා හටගන්නා රෝගවලටයි.
iii. සීල සමාධි ප්‍රඥා නිසා හටගන්නා රෝගවලටයි.
iv. සීත උෂ්ණ අධිකතා නිසා හටගන්නා රෝගවලටයි.

27. ආරෝග්‍යපරමා ලාභා..... යනාදී ගාථාව අනුව පරම සැපය වන්නේ,

i. නිරෝගී බවයි.
ii. සතුටයි.
iii. විශ්වාසවන්තයායි.
iv. නිර්වාණයයි.

28. ආහාර පරිභෝජනය හා බැඳුණු ශිෂ්ට සම්මත ක්‍රියාවක් වන්නේ,

i. ආහාර ළං කිරීමට පෙර මුඛය විවෘත කිරීමයි.
ii. අතගසා දමමින් ආහාර ගැනීමයි.
iii. ඉඳුල් සහිත අතින් පැන් බඳුන ඇල්ලීමයි.
iv. සුරු සුරු හඬ නොනගා ආහාර ගැනීමයි.

29. බුදු දහමේ දිගු කාලීන පැවැත්ම සඳහා සිදු කෙරුණු ප්‍රමුඛ ක්‍රියාවක් වන්නේ,

i. ධර්ම සංගායනා ය.
ii. ධර්ම දේශනා ය.
iii. ධර්ම ප්‍රචාරණය ය.
iv. ධර්ම වාද පැවැත්වීම ය.

30. විහාරස්ථානයක ශාරීරික චෛත්‍යය නිරූපනය කරනුයේ,

i. බුදු පිළිම වහන්සේ ය.
ii. පිරුවානා පොත් වහන්සේ ය.
iii. බෝධීන් වහන්සේ ය.
iv. දාගැබ් වහන්සේ ය.

31. අනුරාධපුරයට අයත් බෞද්ධ සිතුවම් වර්තමානයේත් දක්නට ලැබෙන ස්ථාන දෙකක් වන්නේ,

i. මහියංගනය හා දිඹුලාගලයි.
ii. මහනුවර හා දිඹුලාගලයි.
iii. සීගිරිය හා හිඳගලයි.
iv. කැලණිය හා දඹදෙණියයි.

32. අමාවතුර කෘතිය ලියමින් ගුරුළුගෝමී පඬිතුමා විසින් වර්ණා කරන ලද්දේ බුදුරජාණන් වහන්සේගේ,

i. "පුරිස දම්ම සාරථී" ගුණයයි.
ii. "සත්ථා දේව මනුස්සානං" ගුණයයි.
iii. "සම්මා සම්බුද්ධ" ගුණයයි.
iv. "ලෝකවිදූ" ගුණයයි.

33. දැහැමි රාජ්‍ය පාලනයේදී පාලකයා අනුගමනය කළයුතු එක් අංගයක් වන සතර සංග්‍රහ වස්තු වලට අයත් "අර්ථචර්යාව" යනු,

i. ජනයාට දියුණුව සඳහා ප්‍රාග්ධනය සැපයීමයි.
ii. ප්‍රයෝජනවත් වචන භාවිත කිරීමයි.
iii. ජනතා යහපතට හා දියුණුවට ක්‍රියා කිරීමයි.
iv. සියලු ජනයා කෙරෙහි සම සිතින් ක්‍රියා කිරීමයි.

34. සසර දුක් නිමා කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ දහම් මගට පිවිසීමේ දොරටුව,

i. ගුණවත්කමයි.
ii. සැදැහැවත්කමයි.
iii. ධනවත්කමයි.
iv. මිනිසත්කමයි.

35. අභියෝගවලින් ගහණ වූ බුදු සිරිතේ දක්නට ලැබෙන එක් අභියෝගයක් වන්නේ,

i. දස මර සේනා පැරදවීමයි.
ii. පා ගමනින් වැඩම කිරීමයි.
iii. බිම්බිසාර රජුගේ සහයෝගය ලබාගැනීමයි.
iv. අගසවු දෙනමගේ හැසිරීමයි.

36. "ගිලනුන්ට උපස්ථාන කරන්නා බුදුරජාණන් වහන්සේට උපස්ථාන කරන්නේය." යනුවෙන් භික්ෂූන්ට අවවාද කරන ලද්දේ,

i. පූතිගත්ත තිස්ස තෙරුන්ගේ සිදුවීමේ දී ය.
ii. උදරාබාධයකින් පෙළුණු භික්ෂුවගේ සිදුවීමේ දී ය.
iii. මහා කාශ්‍යප රහත් හිමි රෝගී වූ සිදුවීමේ දී ය.
iv. බුදුරජාණන් වහන්සේ රෝගී වූ සිදුවීමේ දී ය.

37. පාරමිතා ගුණ ධර්ම පුරණ උතුමෙකු තමන්ගේ ජීවිතයම කැපකොට ඉවසීම පුහුණු කරන්නේ නම් එය,

i. නෙක්ඛම්ම පරමත්ථ පාරමිතාවයි.
ii. ඛන්ති පරමත්ථ පාරමිතාවයි.
iii. අධිට්ඨාන පරමත්ථ පාරමිතාවයි.
iv. මෙත්තා පරමත්ථ පාරමිතාවයි.

38. දුර ගමන් කරන්නේත්, තනිව හැසිරෙන්නේත් ශරීරයක් රහිතව ගුහාවක වෙසෙන්නේත්,

i. තමන්ගේ සිත ය.
ii. තමන්ගේ කය ය.
iii. තමන්ගේ වචනය ය.
iv. තමන්ගේ ආත්මය ය.

39. එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය ආරම්භ කිරීමට මූලිකත්වය දරුණු ලැබුයේ

i. හෙන්රි ඕල්කට් තුමා ය.
ii. බ්ලැවැට්ස්කි මැතිණිය ය.
iii. අනගාරික ධර්මපාල තුමා ය.
iv. එඩ්මන් හේවාවිතාරණ මහතා ය.

40. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ දහමෙහි සාරය ලෙස සැලකෙන බෞද්ධයාගේ අත් පොත,

i. ධම්මපදයයි.
ii. ලෝවැඩ සඟරාවයි.
iii. සද්ධර්ම රත්නාවලියයි.
iv. සිරිත්මල්දමයි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 2 |

නම ........................................................................ විභාග අංකය ..............................................

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. ලකුණු 20 කි.
- 2 සිට 7 දක්වා ප්‍රශ්න වලින් තමන් කැමති ප්‍රශ්න 4 ක් තෝරාගෙන පිළිතුරු ලිවිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

01. කෙටි පිළිතුරු සපයන්න.

I. සතර පෙර නිමිතිවලින් දෙකක් නම් කරන්න.
II. මාර දූවරුන් තිදෙනා නම් කරන්න.
III. කෝලිත උපතිස්ස පිරිවැජි තුමන්ලා පැවිදි වූ පසු ලද නම් ගෞරව සහිතව ලියන්න.
IV. බුදුරජාණන් වහන්සේ ඇතුළු හිමිවරුන්ට රළු කටුක ආහාර වැළඳීමට සිදුවූයේ කුමන නගරයේ වස් විසූ කාලයේද?
V. සිවුපසය ලියා දක්වන්න.
VI. "නිබද්ධ චාරිකා" යනු කුමක්ද?
VII. අහිංසක දරුණු මිනි මරුවකු වීම නිසා හඳුන්වනු ලද නම කුමක්ද?
VIII. ලාභෝ අලාභෝ අයසෝ යසෝච යනාදී ගාථාව ලියන්න.
IX. භෞතික වස්තු කැප කරමින් දාන පාරමිතාව පිරූ අවස්ථාව සඳහා උදාහරණ ජාතක කථාවක් නම් කරන්න.
X. පුද්ගල චරිත වර්ග හයෙන් දෙකක් ලියන්න.

(ලකුණු 20)

02. i. "අභියෝගයක්" යනු කුමක් ද? (ල-02)
ii. අභියෝග ජයගැනීම සඳහා බුදුරජාණන් වහන්සේට උපකාරී වූ ගුණාංග තුනක් ලියන්න. (ල-03)
iii. එම ගුණාංග ශිෂ්‍ය ජීවිතයේ දියුණුවට උපකාර වන්නේ කෙසේ දැයි විමසන්න. (ල-05)

03. i. "තාදි ගුණය" යනු කුමක් ද? (ල-02)
ii. බුදුරජාණන් වහන්සේගේ ජීවිතයෙන් එම ගුණය මතුවූ අවස්ථා තුනක් නම් කරන්න. (ල-03)
iii. ඔබේ පවුලේ දියුණුව සඳහා තාදි ගුණය ආදර්ශයට ගැනීම වැදගත් වන අයුරු විස්තර කරන්න. (ල-05)

04. i. “පාරමිතා” යන්න සඳහා තවත් නමක් ලියන්න. (ල-02)

ii. පාරමිතා පිරීමේදී වැදගත් වන කරුණු පහෙන් අත්හල යුතු කරුණු තුන ලියන්න. (ල-03)

iii. පාරමිතා දහයෙන් ඔබ කැමති තුනක් සමාජයේ දියුණුව පිණිස යොදාගත හැකි ආකාරය විස්තර කරන්න. (ල-05)

05. i. “භාවනා” යන වචනයේ තේරුම ලියන්න. (ල-02)

ii. පංච නීවරණවලින් තුනක් තේරුම් සහිතව ලියන්න. (ල-03)

iii. අපගේ ජීවිත විනාශ කර දමන පංච නීවරණ යටපත් කිරීමටත් පරාජය කිරීමටත් භාවනාව උදවු කරගත හැකි ආකරය පහදන්න. (ල-05)

06. i. අත්තනාව කතං පාපං ........ යනාදී ධම්මපද ගාථාව ලියන්න. (ල-02)

ii. එම ගාථාවේ සරල අදහස ලියා දක්වන්න. (ල-03)

iii. වර්තමාන සමාජය යහපත් බවට පත්කිරීමට මෙම ගාථාවේ උපදෙස් භාවිතා කළහැකි ආකාරය විස්තර කරන්න. (ල-05)

07. කෙටි සටහන් ලියන්න.

i. සීලයේ ආනිසංස (ල-05)

ii. රේරුකානේ චන්ද්‍රවිමල මහනාහිමිපාණන් වහන්සේ (ල-05)

iii. තෙමගුල (ල-05)

iv. වටදාගෙය (ල-05)